**තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**-------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ස්ථාවර තැන්පතු 03 ක් සඳහා වූ සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම් රු.500,143 ක ලැබීම් සහ ගෙවීම් ගිණුම්වලට ඇතුළත් නොකිරීමෙන් වර්ෂයට අදාළ ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අවමංගල රථය මිලදී ගැනීම සම්බන්ධයෙන් දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.445,194 ක හිඟ මුදල ප්‍රාග්ධන ණය වශයෙන් සහ සමුච්චිත අරමුදලේ ගිණුම් තබා තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ශේෂ පත්‍රය එම වටිනාකමෙන් අසමානවීද තිබූ බව දක්නට ලැබුණි.

(ඇ) අවමංගල රථය මිලදී ගැනීම සම්බන්ධයෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ණය සංවර්ධන අරමුදලට ගෙවා තිබූ රු.685,856 ක මුදල් පොතේ බැර නොකර බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් ඍජු තැන්පතු වශයෙන් දක්වා තිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පැවැති අතැති මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සභාවේ පොදු බැංකු ගිණුමට ඍජු තැන්පතු වශයෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තැන්පත් කර තිබූ එකතුව රු.4,558,289 ක් හඳුනාගෙන ආදායමට නොගෙන බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් ඍජු තැන්පතු වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල් සහ මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) යුරෝපා සංගමයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.5,000,000 ක වියදමින් ඉදිකර සමාලෝචිත වර්ෂයේ සභාව විසින් භාරගෙන තිබූ විනායගපුරම් පොදු වෙළඳපොල ගොඩනැගිල්ල ගිණුම්වලට ඇතුළත් නොකිරීමෙන් සමුච්චිත අරමුදල් සහ ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සභාවේ ප්‍රතිපාදනවලින් රු.881,679 ක වියදමින් ඉදිකළ වාහන නැවතුම්පොළ ස්ථාවර වත්කම් වශයෙන් දක්වා නොතිබීමෙන් සමුච්චිත අරමුදල් සහ ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස රු.11,855,587 ක් එකතු කර තිබුණත් මූලධන වියදම් සඳහා වූ රාජ්‍ය සහනාධාර ලෙස වටිනාකම රු.6,318,078 ක් සමුච්චිත අරමුදලට එකතු කර තිබීමෙන් සමුච්චිත අරමුදල් රු.5,537,509 කින් අඩුවෙන් දක්වා තිබූ අතර ශේෂ පත්‍රයද එම වටිනාකමෙන් තුලනය නොවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඌ) 2016 වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස රු.17,313,568 ක් එකතු කර තිබුණත් මූලධන වියදම් සඳහා රජයේ සහනාධාර ලෙස වටිනාකම රු.19,431,255 ක් සමුච්චිත අරමුදලට එකතු කර තිබීමෙන්, සමුච්චිත අරමුදල් රු.2,117,686 කින් අඩුවෙන් දක්වා තිබූ අතර, ශේෂ පත්‍රයද එම වටිනාකමෙන් අසමාන වී තිබූ බව නිරීක්ෂණය විය.

(එ) 2016 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රකාරව වර්ග 74 ක කාර්යාල ලී බඩු සමාලෝචිත වර්ෂයේ වෙන්දේසි කිරීම් මඟින් රු.227,950 කට විකුණා තිබූ නමුත්, එම භාණ්ඩවල පිරිවැය තක්සේරු කර ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඒ) 2016 දෙසැම්බර් 31 දිනට නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.4,858,582 ක් වශයෙන් දක්නට ලැබුණත් 2017 ජනවාරි 01 දිනට මෙම ශේෂය රු.4,497,984 ක් වශයෙන් ඉදිරියට ගෙන ඒම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම ණය ශේෂය රු.360,598 කින් අඩුවෙන් පෙන්වා තිබුණි.

### 1.3.3 ලැබිය යුතු මුදල්

2017 දෙසැම්බර් 31 දිනට පැවැති හිඟහිටි රජයේ ප්‍රදාන රු.2,577,194 කින් රු.862,097 ක් වර්ෂ 06 කට අධික කාලයක සිට අයකර ගෙන නොමැතිව තිබුණත්, ඒවා අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

### 1.3.4 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 1,711,438 | වර්ෂ 2 සිට 10 දක්වා වූ කාලයක් කල් ඉකුත්ව ආපසු ගෙවිය යුතුතැන්පතු 32 ක් කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2002 නොවැම්බර් 28 වන දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 600,000 | පරිගණක 06 ක් පරිගණක උපාංග සහ පරිගණක මෘදුකාංග ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,005,795 ක් විය.ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,800,750ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,794,954ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. වරෙන්තු ගාස්තු සහ දඩ ගාස්තු ආදායම් රු.4,208,436 කින් අඩුවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ සාධක වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 40,000 | 5,648 | 5,648 | 7,222 | 30,000 | 1,000 | 1,000 | 7,222 |
| කුලී | 3,295,000 | 3,378,113 | 3,213,038 | 2,552,018 | 3,155,000 | 2,676,576 | 2,344,001 | 2,386,943 |
| බලපත්‍ර ගාස්තු | 687,500 | 586,000 | 586,000 | 17,955 | 665,000 | 108,500 | 113,570 | 17,955 |
| අනෙකුත් ආදායම් | 6,405,000 | 2,343,391 | 2,343,391 | - | 7,001,000 | 2,324,367 | 2,324,367 | - |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---------------------------------------

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකරගත යුතු රු. 8,725,272 ක ආදායමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.6,148,077ක් අයකර ගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 70 % ක්ව පැවතුණි.

**2.2.3 වරිපනම් හා බදු**

--------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ව්‍යාපාරික ස්ථාන 449 ක් සහ නිවාස 8,753ක් මත වරිපනම් තක්සේරු කර අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.4,700,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

**2.2.4 කුලී ආදායම්**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට පැවැති මස් කඩ, මාළු වෙළඳපොල සහ පොදු වෙළඳපොල හිඟ බදු කුලී රු.1,624,003 කින් රු.801,371 ක හිඟ බදු කුලී වර්ෂ 02 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ හිටව පැවැති කුලී ආදායම් රු.928,015 කින් වටිනාකම රු.736,135 ක හිඟ කුලී වර්ෂ දෙකකට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

**2.2.5 දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම**

-----------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීම ප්‍රමාද වීම නිසා සභා බල ප්‍රදේශයේ පුද්ගලික ආයතන විසින් තමන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කර තිබූ දැන්වීම් පුවරු 42 ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් වාර්ෂිකව රු.150,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්යසාධනය**

------------------

**3.1.1 තිරසාර සංවර්ධන අරමුණු (SDG)**

-------------------------------------------

2017 වර්ෂයේ අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත 2030 වර්ෂය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන වැඩසටහනට අනුකූලව සෑම ආයතනයක්ම ක්‍රියාකළ යුතුය. එසේ වුවත්, මේ සම්බන්ධයෙන් ඉලක්කයන් හඳුනාගෙන එය සාක්ෂාත් කරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතනය සහ වෙනත් ආයතනවලින් ලැබී තිබුණු වාහන 06ක් සහ ට්‍රේලර් 03ක් වර්ෂ 02 සිට වර්ෂ 12ක් දක්වා කාල පරාසයක සිට භාවිතා නොකර තිබූ නමුත් ඒවා සභාවේ නමට මාරු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයේ පැවැති සභාවට අයත් ට්‍රැක්ටර් 03 ක්, ගල් රෝල 03 ක් සහ බවුසරයක් ආදිය වර්ෂ 04 කට අධික කාලයක සිට අලුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් ඒවා භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

(ඇ) කිසියම් අරමුණක් සඳහා අත්තිකාරම් ලබාදී තිබුණේද එම අරමුණ ඉටුවූ වහාම අත්තිකාරම් නිරවුල් කළයුතු වුවත්, සභාවේ එවකට හිටපු සභාපති, කොන්ත්‍රාත්කරුවන් සහ තාක්ෂණ නිලධාරී යන අයට ලබාදී තිබූ රු.1,475,168ක අත්තිකාරම් 04ක් වර්ෂ 05කට අධික කාලයක් නිරවුල් කර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යුරෝපා සංගමයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.5,000,000 ක වියදමින් ඉදිකර සමාලෝචිත වර්ෂයේ සභාව විසින් භාරගෙන තිබූ විනායගපුරම් පොදු වෙළඳපොල ගොඩනැගිල්ල ජනශූන්‍ය ප්‍රදේශයක ඉදිකර තිබීම හේතුවෙන් 2018 අගෝස්තු 30 දින වන විටත් අදාල අරමුණ වෙනුවෙන් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු. 76,303ක වියදමෙන් තම්මට්ටෙයි පුස්තකාලය අලුත්වැඩියා කර රු. 144,930ක් වටිනා ලීබඩු හා උපකරණ මෙම පුස්තකාලය වෙනුවෙන් මිලදීගෙන තිබුණි. කෙසේ වුවද, අදාල ලීබඩු, මෙම පුස්තකාලයේ 2018 අගෝස්තු 30 දින වන විටත් ස්ථාපිත නොකර ප්‍රධාන පුස්තකාලයේ ගබඩාගත කර තිබූ අතර අදාල පුස්තකාලයද භාවිතා නොකර නිෂ්කාර්යව තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිකිරීමේ කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර රු.167,000 ක ඇස්තමේන්තුවක් මත ඉදිකිරීම් සිදුකර රු.76,165 ක් වැය කිරීමෙන් අනතුරුව මෙම ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය තුළ සිදුකිරීම හේතුවෙන් මෙම කර්මාන්තය අත්හිටුවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු.101,532ක වියදමෙන් කාබනික පොහොර ඇඹරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණත් 2018 අගෝස්තු 30 දින වන විටත් අදාල අරමුණ වෙනුවෙන් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. තවද, කාබනික පොහොර නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන අලෙවි කිරීමේ මධ්‍යස්ථානය ජන ශූන්‍ය ප්‍රදේශයක පිහිටා තිබීම නිසා ජනතාව විසින් කාබනික පොහොර මිලදී ගැනීම වෙනුවෙන් විශාල දුර ප්‍රමාණයක් ගමන් කිරීමට සිදුවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) තම්බිලුවෙහි මධ්‍යම වෙළෙඳ පොල ඉහළ මාලයේ කඩකාමරවල පිහිටි කඩකාමර 12කින් කඩකාමර 10ක් වර්ෂ 03කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. මේවා භාවිතයට ගැනීම සඳහා සභාව විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගැනීම. |
| | | (ii) | නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ලෙජර් ගිණුම් පවත්වා ගැනීම | | වැය ලෙජර් ගිණුම් සහ මුදල් පොත ආදිය යාවත්කාලීනව පවත්වා ගෙන යාම. |
| (ඇ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |

`